**ශීර්ෂය - 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුවෙන් වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේයයි සලකා 201-2-11-2205 දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන හා දහම් සරසවිය වැඩසටහන වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද රු.6,500,000 ක ප්‍රතිපාදනයෙන් රු. 2,778,350 ක් වියදම් නොකර ඉතිරි කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 43 කි. | දහම් පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන හා දහම් සරසවිය වැඩසටහන වැය විෂය සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.මිලියන 6.5 මාරු කරන අවස්ථාව වනවිට දේශකවරුන්ගේ දීමනා සහ මධ්‍යස්ථාන සඳහා ගෙවීම් වෙනුවෙන් මෙම මුදල ඇස්තමේන්තුගත කරන අතර, පසුව වියදම් කළමනාකරණය කිරීම හේතුවෙන් දේශන පවත්වන මධ්‍යස්ථාන අඩු කිරීමත් ඉන්ධන අර්බුදය සහ පැවැති වාතාවරණය තුල දේශන අවසන් නොකිරීමත් මාර්ගගත ක්‍රම ඔස්සේ දේශන පැවැත්වීමත් හේතුවෙන් අපේක්ෂිත වියදම් අවම වීම නිසා මෙම ඉතුරුවීම් සිදු විය. | ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිපාදන මාරු කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 මාර්තු 11 දිනැතිව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී අමතන ලද GP/F/B/01/37 අංක දරන ලිපිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ඉටු කරගන්නා ලද මුද්‍රණ කටයුතු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති මුදල රු 24, 830,199 ක් වේ. එසේ වුවද, ඒ සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කර නිවැරදිතාවය තහවුරු කර ගෙන නොතිබුණි. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මඟින් දන්වා ඇති රු.24,830,199 ක ගෙවීමට ඇති මුදල සම්බන්ධයෙන් සමාලෝචනය කර නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා එම දෙපාර්තමේන්තුව වෙතින් විධිමත් වාර්තාවක් ඉල්ලා ඇති අතර එයට පිළිතුරු ලද වහාම ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ගෙවීමට ඇති මුදල සම්බන්ධයෙන් සමාලෝචනයක් කර නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කරනු ලබන සමාලෝචන හා ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් හා සමාලෝචනයන් ලිඛිතව සිදු කර ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත පරිදි මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විගණකාධිපති වෙත පිටපත් සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. ප්‍රමාද දෝෂයකින් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| (අ) | මුදල් රෙගුලාසි 103 (1) (ආ) හා 1642 | වාහන සම්බන්ධයෙන් සිදු වන සියළුම හදිසි අනතුරු ළඟම ඇති පොලීසියට වාර්තා කළ යුතු වන අතර එසේ වාර්තා නොකළහොත් ඒ සම්බන්ධව තදින් ක්‍රියා කළ යුතු වුවත් ආසන්න වර්ෂ 03 ක් තුළදී අනතුරු 03 ක් සම්බන්ධයෙන් පොලීසියට වාර්තා කර නොතිබුණු අතර වාහන 2 කට අදාළ අනතුරු ප්‍රමාද වී වාර්තා කර තිබුණි | රටේ පැවති අයහපත් වාතාවරණය මත එක් අනතුරක් සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීමට නොහැකි විය. ඉතිරි අනතුරු දෙක සම්බන්ධයෙන් පැමිණිලි කිරීම ප්‍රමාද විය. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි103 (1) (ආ) හා 1642 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.2 වගන්තිය | වාහනවල බාහිර අළුත්වැඩියාවකදි ටෙන්ඩර් හෝ මිල ගණන් කැඳවීම් කළ යුතු වුවද 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල වාහන 11 ක් අලුත්වැඩියා කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව අළුත්වැඩියාවන් සිදු කර තිබුණි. | මේ වනවිට ක්‍රමවේදය නිවැරදි කර ඒ අනුව කටයුතු කර ගෙන යනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති 02/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ වුවද, 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2022 වර්ෂය සඳහා කාර්තුමය වශයෙන් සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම හා 2022 වර්ෂයේ සෞභාග්‍යයේ දැක්මේ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඒ අනුව කටයුතු කරගෙන ගොස් ඇතත් අනුමැතිය ලිඛිතව ලැබී නොමැත. ඉදිරියේදි නියමිත පරිදි එම අනුමැතිය ලබා ගෙන කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දහම් පාසැල් සඳහා පහසුකම් සැලසීම<br>දහම් පාසැල් ගොඩනැඟිලි හා උපකරණ ලබා දීම සඳහා මූලික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 75 ක් වෙන් කර තිබූ අතර සංශෝධිත ඇස්තමේන්තුවේ එම මුදල රු.මිලියන 40.7 ක් විය. එම ප්‍රත්පාදනයෙන් වර්ෂය තුළ වැය කර තිබූ මුදල, දහම් පාසැල් ගොඩනැඟිලි සඳහා රු. මිලියන 6 ක් සහ උපකරණ ලබා දීම සඳහා රු. මිලියන 4 ක් වශයෙන් රු. මිලියන 10 ක් පමණක් බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර ලේකම්ගේ 2022/04/26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව නව ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොතිබූ බැවින් දහම් පාසැල් සඳහා පහසුකම් සැලසීමට අදාල වැය විෂයයේ ඉතිරිවීම් සිදු විය. | ආයතනයේ ඍජු අරමුණු වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන එම අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝගී කළ යුතු බව. |

### 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 අගෝස්තු 08 දින වේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත පරිදි විගණකාධිපති වෙත පිටපත් සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. ප්‍රමාද දෝෂයකින් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරිමට නොහැකි වී ඇත. | කාර්යසාධන වාර්තාව අදාල කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 2 ක වියදම් දරා තිබුණද වර්ෂය තුළදී දින 04 කදී පමණක් පුහුණුවීම් පවත්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ඉතිරි කාලසීමාව නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | කැළණිය සිල්මාතා පුහුණු ආයතනයේ වර්ෂය පුරා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණද පැවැති ආර්ථික ,දේශපාලන අර්බුදකාරී තත්ත්වය හා 3/2022 වියදම් පාලන චක්‍රලේඛය අනුව වියදම් දැරීම සීමාකර තිබීම හේතුවෙන්අදාල වැඩ සටහන් ක්‍රියාත්මක නොකරන ලදි. | පුහුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කර ගොඩනැගිල්ල ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු බව. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන අනතුරු පරීක්ෂාව<br>අනතුරක් සිදු වූ විට වාහනය මෝටර්රථ පරීක්ෂකවරයෙකු /මෝටර්රථ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතු වන අතර අළුත්වැඩියාවෙන් පසුව අදාළ අලුත්වැඩියාව නිසි පරිදි සිදුකර ඇති බවට සහතිකයක් ලබා ගැනීමෙන් පසුව ගෙවීම් කළ යුතු වේ. එසේ වුවද, අනතුරට ලක් වූ වාහන 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රක්ෂණ සමාගම මඟින් ගෙවීම් කිරීමේදී තාක්ෂනික නිර්දේශ පරිදි ගෙවීම් කරන නිසා වෙනත් තාක්ෂණික නිර්දේශයන් ලබා ගෙන නොමැත. | වාහනයක් අළුත්වැඩියාවට පෙර හා පසු මෝටර් රථ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ ලබා ගත යුතු බව. |
| (ආ) | මහා නායක චාරිකාරාම ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දිනය වන විටත් පවරා ගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත දැනුම් දි ඇති අතර, දැනට මිනුම් කටයුතු සඳහා මැනුම් අධිකාරී(කොළඹ) වෙත දන්වා ඇත. පැවරීමට අදාල කටයුතු ඉන් පසුව සිදු කරනු ඇත. | ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතු බව. |
| (ඇ) | කැලණිය ඊරියවැටියේ දස සිල්මාතා මූලස්ථානය ඉදි කරන ලද ඉඩම 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට පූජ්‍ය වැලිමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශීය | ඉඩම අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන ඇති පියවර හා එහි ප්‍රගතිය විමසා ලිපි යොමුකර ඇත.<br>මේ වනවිට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තිය යටතේ වූ ගැසට් නිවේදනය පළ කර ඇත. | ඉඩම පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01 සිට 03 දක්වා කාල පරාසයකට අයත් රු. 114,330 ක සහ සේවය හැර ගිය නිලධාරියෙකුගේ අයවිය යුතු වර්ෂ 04 කට වැඩි කාලයක සිට පැවත එන රු. 134,710 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය එක් නිලධාරියෙකුගේ ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති අතර මියගිය අනෙක් නිලධාරියා වන ස්වාමීන් වහන්සේගේ මරණ පාරිතෝෂිකය මේ වන තෙක් ඉල්ලුම් කර නොමැති බැවින් ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා හැකියාවක් නොමැත.මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීමට කටයුතු කරමි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 44 ක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | අදාල විගණන විමසුම් 44 න් 10ක් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවලට අයත් වන අතර ඒවාට පිලිතුරු ඉදිරිපත් කර ඇත. ඉතිරි විමසුම් 34 විහාර දේවාලගම් හා දේවාලවලට අදාල වන අතර, ඉන් 5 කට පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉතිරි විමසුම් 29 සම්බන්ධයෙන් සිහි කැඳවීම් ලිපි යවා ඇත. තවද ඉදිරියේදී විහාර හා දේවාල වලට අදාල | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා කඩිනමින් අදහස් දැක්වීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| | විගණන විමසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් නිලධාරි යෙකු නම් කර එම නිලධාරියා මඟින් නිරන්තර පසු විපරම් කිරීම හා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | |

**5. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති 18/2001 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුව තුල වර්ෂ 05 සිට වර්ෂ 21 ට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින් 571 ක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර එය 2022 දෙසැම්බර් 31 දිනට 752 ක් වු දෙපාර්තමේන්තු නිලධාරින්ගෙන් සියයට 76 කි. | දෙපාර්තමේන්තුගත තනතුරක් වන බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මනාපය පළ කර නොමැති බැවින් එම ස්ථාන මාරුවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව, ස්ථාන මාරුවීම්වලට යටත්වේ.<br>එම නිලධාරීන්ද මාණ්ඩලික නිලධාරීන්ද හැර අනිකුත් සියලුම නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසිනි. දෙපාර්තමේන්තුව තුළ වසර 05 කට වැඩි කාලයක් සේවය කරන නිලධාරීන් පිළිබඳ ලේඛණය සෑම වසරකම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |